# 2.31 ප්‍රාදේශීය සංවර්ධන උපාය මාර්ගයක් ලෙස ගොවිජනතාවගේ දිළිඳුකම අවම කිරීමේදී පොහොර සහනාධාරයේ බලපෑම (ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්)

කේ. පී.එල්. නිශාන්ත පටබැඳි , එස්. ඒ.ඒ. ඩී සමරසිංහ
සමාජීය විද්‍යා අධ්‍යයන අංශයල ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය෴ බෙලිහුල්ඔය
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් කාර්යාලය, කුරුණෑගල

## ABSTRACT

"කෙතට අරුණ" සංකල්පය යටතේ ලබා දෙන පොහොර සහනාධාරය ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන උපාය මාර්ගයක් ලෙස සැලකේ. ගොවි ජනතාවගේ දිළිඳුකම අවම කිරීම සඳහා එමගින් ඇති කරන බලපෑම අධ්‍යයනයෙන් සොයා බලනු ලැබේ . ගොවිජනතාවගේ දිළිඳුකම අවම කිරීම සඳහා පොහොර සහනාධාර ලබාදීම ප්‍රාදේශීය සංවර්ධන උපාය මාර්ගයක් වශයෙන් කොතෙක් දුරට ඵලදායී වීද යන්න සොයා බැලීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණයි. ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වී වගාව බහුලව සිදුවන නිසා ක්ෂෙත්‍රය වශයෙන් ගෙන ඇත . ද්වීතියික දත්තවලට අමතරව ස්තෘත සසම්භාවී ලෙස තෝරාගත් ගොවි නියැදියක් වෙත ප්‍රශ්ණාවලියක් ලබාදී දත්ත රැස් කෙරිණ. දත්ත විශ්ලේශණය සඳහා කේන්ද්‍රික ප්‍රවනතා මිනුම්, කල්පිත පරීක්ෂාව සහ කාල ශ්‍රේණි විශ්ලේශණය භාවිතා කර ඇත. පොහොර සහනාධාරයට පෙර දැරීමට සිදුවූ අධික වගා පිරිවැය සහනාධාරය නිසා ඩු වී ඇති අතර වී වගා කිරීමේදී මතුවූ පිරිවැය සොයා ගැනීම, ණය ආපසු ගෙවීම, අස්වැන්න සුදුසු මිලකට විකුනා ගැනීම වැනි ගැටළුවලට පොහොර සහනාධාරයෙන් පසුව සතුටුදායක විසඳුම් ලැබී ඇත. අක්කරයකින් ලබා ගන්නා ශුද්ධ ආදායම වැඩිවී ඇත.පොහොර සහනාධාරය ආරම්භයත් සමග ගොවි ජනතාවගේ දිවිනසා ගැනීම් සීඝ්‍රයෙන් අඩුවී ඇත. පොහොර සහනාධාරයට පෙර කුඹුරු පුරන් කිරීමට තදබල ලෙස හේතු වී ඇත්තේ පිරිවැය අධික වීමයි. තම පුරන් කුඹුරු යලි අස්වැද්දීමට ගොවීන් පෙළඹී ඇත. පොහොර සහනාධාරයට පසුව බහුතරයක් ගොවීහු තම වී අස්වැන්න කමතේදීම විකිනීම නොකරති. ගොවීන්ගේ ණයගැති භාවය අඩු වී ඇත . ගොවි උපකරණ මිලදී ගැනීමේදී වඩාත් වැඩි ප්‍රවනතාවක් ඇත්තේ පොහොර සහනාධාරයෙන් පසුවය. පොහොර සහනාධාරය ගොවීන්ගේ ජීවන තත්වය කෙරෙහිද ග්‍රාමීය ආයෝජන කෙරෙහිද ධනාත්මකව බලපා ඇත. ගොවිජනතාවගේ දිළිඳුකම අවම කිරීම සඳහා පොහොර සහනාධාර ලබාදීම ප්‍රාදේශීය සංවර්ධන උපාය මාර්ගයක් වශයෙන් සාරථක ප්‍රතිඵල අත්කරගෙන තිබේ.